JMC vLearning

"your virtual learning partner"

# ආචාරධර්ම සහ සමාජ වගකීම

තරංග ජයනන්ද

## ව්‍යාපාර පරිසරය - 60%

- ව්‍යාපාර හා ආයතනික පරිසරය
  - ව්‍යාපාර සංවිධාන හැඳින්වීම
  - ව්‍යාපාර පරිසරය
  - ආචාරධර්ම සහ සමාජ වගකීම
- ව්‍යාපාර කළමනාකරණයේ ස්වභාවය සහ අවකාශය
  - ව්‍යාපාර කළමණාකරනය
- කළමනාකරණයේ කාර්යයන්
  - සැලසුම්කරණය සහ පාලනය
  - සංවිධාන ව්‍යුහය
  - නායකත්වය, අභිප්‍රේරණය සහ සන්නිවේදනය

©JMC vLearning

## ව්‍යාපාර පරිසරය - 60%

- ව්‍යාපාරවල ක්‍රියාකාරී ක්ෂේත්‍ර
  - මෙහෙයුම් කළමණාකරනය
  - අලෙවි කළමනාකරණය
  - මානව සම්පත් කළමනාකරණය
  - කළමනාකරණ තොරතුරු පද්ධති සහ ව්‍යාපෘති කළමනාකරණය






JMC vLearning
"your virtual learning partner"

## පරිච්ඡේදයේ අන්තර්ගතය

1 සංවිධානය සහ ආචාරධර්ම

2 සමාජ වගකීම



## ව්‍යාපාර ආචාරධර්ම

ව්‍යාපාරයක් තම කටයුතු කරගෙන යාම් දී තමාටත්, සෙසු පාර්ශවයන්ටත් හා පුළුල් වශයෙන් මුළු මහත් සමාජයටත් යහපතක් සැලසෙන පරිදි කටයුතු කිරීමයි

නැතහොත්,

හොඳ නරක පිළිබඳ මනා වැටහීමකින් තම ව්‍යාපාරික කටයුතු සිදු කිරීමයි

ආචාරධර්ම සඳහා වන අවබෝධ කරගැනීමේ මානසික ක්‍රියාවලිය හෙවත් ප්‍රජානන ප්‍රවේශයෙන් අදහස් කරනු ලබන්නේ අරමුණු සහගත සදාචාර සම්පන්න සත්‍යතාවන් ස්ථාපනය කල හැකි බවයි .

## ආචාරධර්ම සහ ව්‍යාපාර

ආචාරධර්ම සැලකිලිමත් වන්නේ වැරැද්ද සහ නිවැරැද්ද සහ හැසිරීම හොඳ ද නරකද යන්න කෙසේ විනිශ්චය කල යුතු ද යන්න පිලිබඳවයි එය අප කෙසේ අපගේ ජීවිත ගත කල යුතු ද යන්න සහ විශේෂයෙන් අපි අනික් අය සමග කෙසේ හැසිරිය යුතුද යන්න පිලිබඳව වේ .

©JMC vLearning

## ප්‍රජානනමය නොවන සහ සදාචාරමය සාපේක්ෂතාවාදය

ප්‍රජානනමය නොවන ප්‍රවේශයෙන් යෝජනා කෙරෙන්නේ, සදාචාරමය ප්‍රකාශනයන් යනු අවශ්‍යයෙන්ම පුද්ගලස්ථ වන අතර ඒවා දේශකයාගේ සංස්කෘතික පසුබිම, විශ්වාසයන් සහ ආවේගයන් නිසා පැන නගින බවයි.

## ප්‍රජානනමය ආචාරධර්ම

ආචාරධර්ම සඳහා ප්‍රජානනමය ප්‍රවේශය ගොඩ නැගී ඇත්තේ අරමුණු සහගත ලෙස සමස්තයක් ලෙස යොදා ගත හැකි යුක්තායුක්ත සත්‍යයන් පවතින්නේය යන සහ එය දැන ගත හැකිය යන මූළධර්මය මත වේ.

## ප්‍රතිවිපාකමය ආචාරධර්ම (උපයෝගීතාවාදය)

ආචාරධර්ම සඳහා ප්‍රතිවිපාකමය ප්‍රවේශය වන්නේ ක්‍රියා මාර්ගයන් පිලිබඳව ඒවායේ ප්‍රතිපල සහ ප්‍රතිවිපාක පිලිබඳව යොමු වෙමින් යුක්තායුක්ත විනිශ්චයන්ට එළඹීමයි එනම් වැරැද්ද හෝ නිවැරැද්ද යන්න හානිය හෝ යහපත පිලිබඳව ප්‍රශ්නයක් වන බවයි.

©JMC vLearning

## යුක්තිවේදමය ආචාරධර්ම

යුක්තිවේදය සැලකිල්ල දක්වනුයේ හැසිරීම පිලිබඳව නීති රීති වලට ලඟාවීම සඳහා සමස්ත සදාචාරමය මූලධර්මයන් යොදා ගැනීමයි. කෙසේ වුවත් ප්‍රතිවිපාකකරුවන්ගේ ප්‍රවේශය වන්නේ ක්‍රියාවන් එහි ප්‍රතිපලවලින් විනිශ්චය කරනු ලැබීමයි

යුක්තිවේදය විසින් යමක් කලින් විනිශ්චය කරගත හැකි පරිදි ප්‍රමුඛතා මිනුම් දණ්ඩ (a priori criteria) නියම කරනු ලැබේ

යුක්තිවේදමය සදාචාරයේ නිශ්චිත ප්‍රතිකාරය කාන්ට් (1780) ගේ වැඩවල දක්නට ලැබේ

කාන්ට් (1780)යෝජනා කොට ඇත්තේ අපි කරුනු පිලිබඳව යුක්තායුක්ත විනිශ්චයන් කරන්නේ නම් අප විසින් විනිශ්චය කිරීමේ මිනුම් දඬු කරුනු වලින් වෙනස්ව පවතින බවයි

මිනුම් දඬු අපගේ අභ්‍යන්තරයෙන් එන අතර ඒවා පදනම් වන්නේ ද්‍රව්‍ය වල ස්වභාවය පිලිබඳව ප්‍රතිභාපූර්න දැනුවත්භාවය මතවේ

©JMC vLearning

කාන්ට (1780) අනුව යුක්තායුක්ත හැසිරීම අර්ථ දක්වන්නේ ඒකාන්තයෙන්ම පැහැර හැරිය නොහැකි හෙවත් අනුලංගනීය දේ යනුවෙනි. ඒකාන්ත අනුලංගනයන් කවරකාරයෙන් හෝ ප්‍රතිඵලයට යොමු දැක්වීමකින් තොරව ගනු ලබන ක්‍රියා මාර්ගය විග්‍රහ කරයි, අපි යම් ආකාරයකින් ක්‍රියා කල යුත්තේ මන්ද යත් එසේ කිරීම නිවැරදි හෙයිනි - නිවැරදි හැසිරීම එහිම නිමාව වේ.

### කාන්ට (1780) අනුව ඒකාන්ත අනුලංගනයන්හි සූත්‍රයන්

- කිසිම විටක ඔබ වෙනත් අයව ගර්භාවට පත්කරන ලෙසින් හැසිරෙන්න එපා
- මිනිසුන් කිසි විටකත් තමන්ගේ අවසාන ඉලක්කයට යාමට (එගොඩ වීමට පාලමක්) මාර්ගයක් පමනක් ලෙස සැකීමෙන් වලකින්න.

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## ස්වාභාවික නීතිය

ආචාරධර්ම සඳහා ස්වාභාවික නීතිය පිලිබඳ ප්‍රවේශය පදනම් වන්නේ අරමුනු මාලාවක් හෝ ස්වාභාවික යුක්තායුක්ත නීති රීති පවතින්නේය යන අදහස මත සහ මෙකී නීති රීති අපට දැනගන්නට ලැබේය යන අදහස මතය.

ව්‍යාපාරික ආචාරධර්මට අනුව ස්වාභාවික නීතිය යන ප්‍රවේශය කටයුතු කරන්නේ බෙහෙවින්ම අයිතිවාසිකම් සහ යුතුකම හෙවත් රාජකාරිය මතය. අයිතිවාසිමක් පවතින්නේ කොතනද එම අයිතිවාසිකමට ගරු කිරීම සඳහා වන යුතුකම ද එතැන ඇත්තේය.

## අවේනික සත්ගුණයක් වන ආචාරධර්ම

ආවේනික සත්ගුනයක් වන ආචාරධර්ම පිලිබඳ ප්‍රවේශයේ අඩංගු වන්නේ සුහදශීලී හෝ සත්ගුණවත් (සාදුගුණ සහිත) ජීවිතයක් ගත කිරීම සහ හොඳ නරක කුමක්ද යන්න පිලිබඳව තර්කානුකූල විනිශ්චයක් කිරීම වේ. එක්තරා දුරකට මෙය කවරකාරයක වුව අන්තයන් වලක්වා ගැනීමයි

©JMC vLearning

## ආචාරධර්ම ක්‍රමෝපාය

ආයතනයේ ක්‍රමෝපායික තීරන ගැනීම සම්බන්ධව වග කිව යුතු කළමණාකරුවන්ට තම ආයතනයේ සදාචාරමය ස්ථාවරය පිලිබඳ වගකීම නොසලකා හැරිය නොහැකිය. සිදුවිය හැකි අයහපත් වර්ධනයන් පෙරා හැරීම සඳහා ඔවුන්ගේ සෑම තීරණයකදීම දැනුවත්වම සදාචාරමය නීති රීති ඔවුන් විසින්පිලිපැදිය යුතු වේ

## සදාචාරමය උභතෝකෝටිකයක්

සදාචාරමය ප්‍රවේශයන් සහ ව්‍යාපාරික වගකීම පිලිබඳ එකිනෙක ගැටෙන සිතුම් පැතුම් හේතු කොට ගෙන කළමණාකරුවන් සඳහා සදාචාරමය උභතෝකෝටිකයන් නිර්මාණය වන කාර්යපථ ප්‍රදේශයන් රාශියකි. විශේෂයෙන් වඩාත් ජ්‍යෙෂ්ඨ පුද්ගලයන්ගෙන් මඟ පෙන්වීම් රහිත වන විට සහ ප්‍රතිපත්ති අපැහැදිලි වන විට ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් හෝ ධුරාවලිය පහලට ඉහලම මට්ටමෙන් සිදුවන හානිය ඉතා වැඩියි.

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## ආචාරධර්මයන්ට පටහැනි ගෙවීම් කිරීම්

සමාගම් විසින් තම ආයතනයේ මෙහෙයුම් සඳහා උදව් කරන සහ බාධා කරන (පිටස්තර) බලය ඇති නිළධාරීන්ට ගෙවීම් කිරීමයි

- බලහත්කාරයෙන් ලබාගැනීම (ත්‍රාසාද්ග්‍රහනය)
- අල්ලස්
- ලිස්සන මුදල් (Grease money)
- තෑගි






©JMC vLearning

## සංස්ථායික ආචාරධර්මයන්හි විෂය පථය

සංස්ථායික ආචාරධර්මයන් සන්ධර්භයන් තුනක් යටතේ සලකා බැලිය හැකිය

- ආයතනය ජාතික හා අන්තර් ජාතික සමාජ සමග කරන්නා වූ අන්තර් ක්‍රියාකාරීත්වයන් යටතේ
- ආයතනයේ සිරිතක් වශයෙන් කෙරෙන මෙහෙයුම් කටයුතු වල බලපෑම මත
- කාර්ය මණ්ඩලයේ තනි පුද්ගලයන්ගේ හැසිරීම මත

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## සංස්ථායික සදාචාරධර්ම කාර්ය සංග්‍රහය

ව්‍යාපාරයක සේවකයින් විසින් අනුගමනය කලයුතු ආචාරධර්මානුකූලව හැසිරීමට අදාළ වූ ආචාර ධර්ම ඇතුලත් ලිඛිත සංග්‍රහයකි.

### ආචාර ධර්ම සංග්‍රහයක වැදගත්කම

- ❖ සේවකයින් විසින් ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කිරීමට පෙළඹීම
- ❖ සේවක ඵලදායිතාවය ඉහළ යාම හා ශ්‍රම පිරිවැය පහළ යාමට හේතු වීම
- ❖ ආයතනයේ කීර්තිනාමය ඉහළ නැංවීමට හේතු වීම
- ❖ පෙර සිදු වූ යල්පැන ගිය විෂමාචාර වැලකී යාම
- ❖ විවිධ ව්‍යාපාර ශ්‍රිතයන් සඳහා ආචාරධර්ම සංග්‍රහය පිළියෙල කිරීමට හැකි වීම.

©JMC vLearning

## ආචාර ධර්ම සංග්‍රහයක් පිළියෙළ කිරීමේ දී සැලකිය යුතු කරුණු

- තම ව්‍යාපාරයේ ස්වාභාවය
- ව්‍යාපාරයේ අයිතිකරුවන් කවුරුන්ද ඔවුන්ගේ ආකල්ප සංජානනයන් වටිනාකම් මොනවාද යන්න
- ව්‍යාපාරයේ සේවකන් කවුරුන්ද ඔවුන්ගේ ආකල්ප සංජානනයන් වටිනාකම් මොනවාද යන්න
- ගනුදෙනුකරුවන් පිළිබඳ සැළකිල්ල යොමු කිරීම
- තරඟකරුවන් පිළිබඳ සැළකිල්ල යොමු කිරීම
- ව්‍යාපාර සංස්කෘතියේ ස්වාභාවය
- ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිද යන්න
- නෛතික එකඟතාවය
- පිරිවැය
- පැන නැඟිය හැකි ගැටළු මොනවාද යන්න.

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## ආචාර ධර්ම සංග්‍රහයක් මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ

- සේවකයින් එම ආචාර ධර්ම වලට අනුකූලව කටයුතු කිරීමට පෙළඹීම හා කාර්මික සම්බන්ධතා යහපත් වීම
- ව්‍යාපාරයේ මූල්‍ය කටයුතු කාර්යක්ෂම වීම
- පෙර සිදුවූ යල් පැනගිය විෂමාචාර වැලකී යාම
- විවිධ ව්‍යාපාර ශ්‍රිතයන් සඳහා ආචාර ධර්ම පිළියෙල කිරීමට හැකිවීම
- ව්‍යාපාරය පිලිබඳ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය තහවුරු වීම
- තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි විම.

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

## ටකර්ගේ ප්‍රශ්ණ 5හේ මොඩලය

ටකර්ගේ ප්‍රශ්ණ 5 හේ මොඩලය කිසියම් අවස්ථාවක් සඳහා වඩාත් උචිතම සදාචාරාත්මක ප්‍රතිඵලය නිගමනය කිරීමට විශේෂයෙන් ව්‍යාපාර සඳහා වන සදාචාරත්මක ගැටලු නිගමනය කිරීමට යොදාගත හැක එය ප්‍රධාන ප්‍රශ්ණ පහක් කෙරෙහි යොමු කරනු ලබයි. තීරණය:

- ❖ ලාභදායක
- ❖ නෛතික
- ❖ සාධාරණ
- ❖ නිවැරදි
- ❖ දිගටම පවත්වාගන යා හැකිද (ස්ථිරසාරද)

©JMC vLearning

| තීරණය | |
|---|---|
| **ලාභ දායක නම් ?** | සන්සන්දනය කරන්නේ කුමක් සමගද ? ලාභදායකත්වය මිණුම් දණ්ඩක් ලෙස භාවිතා කිරීම ද හඟවන්නේ ටකර්ගේ මොඩලය තනි පුද්ගල සාරධර්ම අර්බුධ වලට වඩා ව්‍යාපාර තීරණ සඳහා වඩාත් ප්‍ර යෝජනවත් බවයි. |
| **නෛතකද?** | මෙය ප්‍රත්‍යක්ෂ ලෙසම රඳාපවත්නේ අදාලවන නෛතික බල ප්‍රදේශ මත වේ |
| **සාධාරණද ?** | කවරකුගේ සාපේක්ෂ වැදගත් කම සඳහාද? උනන්දුකාරක පාර්ශවයන් කවුද යන්න සහ තීරණ කෙසේ ඔවුන් වෙත බලපාන්නේද යන්න ගැන සැලකිල්ල දැක්වීම අවශ්‍යය වේ. |
| **නිවරදි ද?** | මෙය රඳා පවතින්නේ සදාචාරමය තත්ත්වය මත වේ; විශේෂයෙන් සඳහන් කරන්නේ නම් ගණුදෙනුවක ප්‍රතිවිපාකයන් පිලිබඳව යුක්තායුක්ත භාවය සහ සාධ්‍යතාවාද ප්‍රවේශය (අවසාන හේතුව පිලිබඳ ධර්ම ප්‍රවේශය) අතර වෙනස ගණන් ගත යුත්තේද යන්න වැදගත් වේ. |
| **පවත්වා ගෙන යා හැකිද ?** | තීරණය පාරිසරිකමය වශයෙන් ප්‍රශස්තද යන්න හෝ වෙනත් ආකාරයකින් පවත්වා ගත යා හැකිද යන්න ? |

©JMC vLearning

# ආචාරධර්ම සහ ගණකාධිකරන වෘත්තීය

බොහෝ මූල්‍ය තොරතුරු පරිචකයන් ඔවුන්ගේ ක්‍රියාවන් මත විශ්වාසය තබන බැවින් ආචාරධර්ම හෙවත් ආචාර ධර්ම ගණකාධිකාරීන් සඳහා වැදගත් සලකා බැලිය යුතු දෙයක් වේ

ගණකාධිකාරීවරයකුගේ වගකීම වන්නේ පරම වශයෙන්ම තනි පුද්ගල සේවාදායකයකුගේ හෝ සේව්‍යයාගේ අවශ්‍යතාවන් තෘප්ත කිරීම නොවේ මහජන යහපත වෙනුවෙන් සේවය කිරීමට ඔවුන්ට යුතුකමක් ඇත්තේය



©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

# මූලධර්මීය ප්‍රතිපත්ති

අචාරධර්ම සංග්‍රහයට අනුව ගණකාධිකාරීවරුන් මූලධර්මීය ප්‍රතිපත්ති පහකින් බැඳී සිටී මෙම ප්‍රතිපත්ති නිර්මානය කොට ඇත්තේ ගණකාධිකාරීවරුන් පොදු ජනතා ඇල්ම වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සහ සමාජය බලාපොරොත්තුවන දේ ලබාදීම සහතික වනු පිනිසය

- ❖ වෘත්තීය ප්‍රවීනත්වය සහ නිසි සැලකිල්ල
- ❖ සාධුගුණය
- ❖ වෘත්තීය හැසිරීම
- ❖ රහස්‍යභාවය
- ❖ අරමුණුගත බව

©JMC vLearning

| මූලධර්මීය ප්‍රතිපත්ති | |
|---|---|
| වෘත්තීය ප්‍රවීනත්වය සහ නිසි සැලකිල්ල | පරිචයන්හි, නෛතික විදිවිධාන වල සහ ක්‍රම වේදයන්හි වර්තමාන ප්‍රගතීන් මත පදනම්ව සේවාදායකයකු හෝ සේව්‍යයකු විසින් ප්‍රවීන වෘර්තීය සේවාවක් ලැබීම සහතික වීම සඳහා අවශ්‍ය වන මට්ටමකින් තම වෘත්තීය දැනුම සහ හැකියාවන් පවත්වා ගැනීම සම්බන්දයෙන් සාමාජිකයකුට පැහැර හැරිය නොහැකි අඛණ්ඩ වගකීමක් ඇත. සාමාජිකයා විසින් වෘත්තීය සේවාවන් සැපයීමේදී මනා සැලකිල්ලෙන් යුතුව සහ අදාල වන වෘත්තීය සහ තාක්ෂණික ප්‍රමිතයන්ගෙන් යුක්තව ක්‍රියා කල යුතුය. |
| සාධුගුණය (Integrity) | සියලුම ව්‍යාපාරික සහ වෘර්තීය සම්බන්ධතාවලදී සාමාජිකයා විසින් විවෘත්ත ලෙස කෙලින්ම සහ අවංකව කටයුතු කල යුතුය. |

©JMC vLearning

JMC vLearning "your virtual learning partner"

| මූලධර්මීය ප්‍රතිපත්ති | |
|---|---|
| වෘත්තීය හැසිරීම | සාමාජිකයන් විසින් අදාල නීති සහ රෙගුලාසි පිලිපැදිය යුතු අතර වෘර්තියට නිගා ගෙන දෙන ක්‍රියාවන්ගෙන් වැලකිය යුතුය. |
| රහස්‍යභාවය | වෘර්තීය සහ ව්‍යාපාර සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන් අත්පත් කරගන්නා හෙවත් ලබාගන්නා ලද **තොරතුරුවල රහස්‍යභාවයට** සමාජිකයා ගරුකල යුතු අතර හෙලිදරව් කිරීම සඳහා වෘත්තීය හෝ නෛතික වගකීමක් නැති විට විධිමත් සහ නිසි අවසරයකින් සහ නිසි අධිකාරී බලයකින් තොරව ඒවා තුන්වන පාර්ශවයන් අතට පත් නොකල යුතුය. වෘර්තීය සහ ව්‍යාපාර සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන් අත්පත් කරගන්නා හෙවත් ලබාගන්නා ලද රහසිගත තොරතුරු සාමාජිකයාගේ හෝ තුන්වන පාර්ශවයන්ගේ පෞද්ගලික වාසි සහ ඵල ප්‍රයෝජන සඳහා භාවිත නොකල යුතුය. |
| අරමුණුගත බව | සාමාජිකයන් විසින් වෘත්තීය හෝ ව්‍යාපාරික විනිශ්චයන් ඉක්මවා යන ලෙසට අගති සහගත, ඇල්මයන් අතර ඝට්ටනයන් ඇතිවන හෝ අනිසි බලපෑමක් ඇති කරන ආකාරයට කටයුතු කිරීමට අනෙක් අයට ඉඩ නොදිය යුතුය. |

©JMC vLearning

# මූලධර්මීය ප්‍රතිපත්ති වලට අනුකූලවීම සම්බන්ධයෙන් ඇත්තා වූ සදාචාරමය තර්ජනයන්

මූලධර්මීය ප්‍රතිපත්ති වලට අනුකූලවීම සම්බන්ධයෙන් පවත්නා සදාචාරමය තර්ජනයන් ගණනාවක් ද හඳුනා ගෙන ඇත

- ස්වයං ඇල්ම
- ස්වයං සමාලෝචනය
- උපදේශනය
- සුහදශීලීවීම
- තර්ජනය

©JMC vLearning

| තර්ජනය | අර්ථ නිරූපනය | උදාහරන |
|---|---|---|
| **ස්වයං ඇල්ම** | වෘත්තීය ගණකාධිකාරීවරයාගේ මූල්‍යමය හෝ වෙනත් ඇල්මක් හෝ ඔහුගේ ආසන්නතම පවුලේ සාමාජිකයකු විසින් තීන්දුවක් සඳහා අදාල නොවන ආකාරයෙන් කරනු ලබන බලපෑම් සහ එවැනි ආකාරයේ හැසිරීම් | සේවාදායකයකු සමග පවත්නා මූල්‍යමය ඇල්ම |
| **ස්වයං සමාලෝචනය** | තීන්දුව ගන්නා ලද ගණකාධිකාරීවරයා විසින්ම හෝ එම ආයතනයේම සාමාජිකයක් විසින් එම තීන්දුව ඇගයීම | (තම) ආයතනය විසින් සකස් කරන ලද මූලය ප්‍රකාශන තම ආයතනය මගින්ම විගණනය කිරීම |
| **උපදේශනය** | අරමුණුගත භාවය හෑල්ලුවට ලක්වන ආකාරයෙන් ගණකාධිකාරීවරයා තම තනතුර හෝ මතයට තුඩුදෙන කාරණය ප්‍රවර්ධනය කිරීම | නීති කර්තව්‍යයකදී සේවාදායකගේ කාර්යයක් වෙනුවෙන් උපදේශනය |
| **සුහදශීලීවීම** | අනුන් කෙරෙහි දැඩි ලෙස විශ්වාසය තබා කටයුතු කරන සහ අනුකම්පාව දක්වමින් කටයුතු කිරීමට පොළඹවන සමීප සම්බන්ධතාවන් | විගණන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ පවුලේ අය සේවාදායකයා සමග සිටීම |
| **තර්ජනය** | සත්‍ය හෝ සිතෙහි පවත්නා පීඩනය හේතුවෙන් ගණකාධිකාරීවරයා අරමුණුගතබාවයෙන් කටයුතු නොකිරීම් | එකඟ නොවීම හේතුවෙන් ප්‍රතිස්ථාපනය කිරීමේ තර්ජනය |

©JMC vLearning

# ව්‍යාපාරයන්හි සමාජ වගකීම

- ව්‍යාපාරයක සමාජ වගකීම යනුවෙන් අදහස් කරන්නේ ආයතනය විසින් පොදුවේ සමාජයට වන වගකීම කොතරම් දුරට හඳුනා ගන්නේද යන්නයි

- සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත් එමගින් ව්‍යාපාරයට ඇතිවන බලපෑම පිළිබඳවත් පෞද්ගලිකවම ව්‍යාපාර විසින් වගකීමට බැඳීමය

ඇමරිකා එක්සත් ජනපදය

- ව්‍යාපාර විසින් සමාජයට ආපසු දෙන දෑ සමාජ වගකීමයි.

පිලිපීනය

- අද අවශ්‍යව ඇත්තේ සමාජ වගකීම පිළිබඳව තවත් කතා කිරීම නොව එහිලා යමක් කර පෙන්වීමයි. එසේම වඩාත් ස්ථාවර, සෞඛ්‍ය සම්පන්න සශ්‍රීක ලෝකයක් ළඟාකර ගැනීම සඳහා සෑම රටකම ව්‍යාපාර කොටස්කරුවන් විය යුතුයි

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමාජ වගකීම පිළිබඳ ඉදිරිපත් කරන අදහස

©JMC vLearning

## සංස්ථායික සමාජ වගකීම

විශේෂයෙන්ම විශාල ව්‍යාපාර ඔවුන් විසින් සමාජ වගකීම ක්‍රියාත්මක කරනු ලබනු ඇතැයි වැඩිපුරම බලාපොරොත්තු වේ. මෙය වැරදි ලෙස අර්ථ නිරූපිත සංකල්පයක් වන නමුත් පුණ්‍යමය පරිත්‍යාග,රැකියාවන් නිර්මානය සහ සුරැකීම සහ පරිසරය වැඩි දියුනු කිරීමට හෝ නඩත්තු කිරීමට වැනි පොදුවේ සමාජයට විශේෂිත වාසි සැපයීම ඉලක්ක කරගත් දෙයක් බවට නිගමනය කල හැකිය

ෆරයිඩ්මෑන් (1970) පහත සඳහන් කාරනා මත සංස්ථායික සමාජ වගකීමට එරෙහිව වාදකරන ලදී

❖ ව්‍යාපාරවලට වගකීමක් නැති අතර වගකීමක් ඇත්තේ ජනතාවට පමනි

❖ මෙම සේවකයන්/ අයිතිකරුවන් සමාජ සුභ සාධනය ඉලක්කයක් ලෙස තබා ගත්තත් පොදුවේ සමිතිවලට අවනතව මුදල් ඉපයීම මූලික අභිප්‍රාය කර ගනිති

❖කළමණාකරුවන් සතුව සමාජ වගකීමක් ඇතැයි යන අදහසට අර්ථයක් ඇත්නම්, එයින් අදහස් කරන්නේ ඔවුන්ගේ සේවා යෝජකයින්ගේ කැමැත්තට පිටින් ඔවුන් කටයුතු කලයුතුය යන්න විය හැකිය

©JMC vLearning

❖ කළමනාකරුවන් එසේ කරන්නේ නම් සාමාන්‍යයෙන් කියන පරිදි ඔවුන් විසින් සිය හිමිකරුවන්ගේ මුදල් තමන්ට බලය පවරන ලද කාර්යන් සඳහා නොව වෙනත් කාරනා සඳහා වියදම් කරයි

සංස්ථායික සමාජ වගකීම පිලිබඳ උපකල්පනයට එරෙහිව ඇති දෙවන තර්කය නම් ව්‍යාපාර කටයුතු වලින් සමාජයට වාසි ලබා ගත හැකි හොඳම ක්‍රමවේදය නම් ධනය උපරිම කර ගැනීම බවය

❖ ධනය උපරිම කර ගැනීම මගින් සමාජ හිතකාමී අරමුණු සඳහා වියදම් කිරීම පිනිස රජයට බදු ආදායම් වැඩි කර ගැනීමේ අවශ්‍යතාව ඇති වේ

❖ කොටස් හිමියන්ගේ අගය උපරිම වීම තුලින් සමාජයේ අවාසි සහගත තත්ත්වයේ පසුවන සාමාජිකයන් මත සමාජයේ ධනවතුන් සංඛ්‍යාව ඉහල ගිය විට එමගින් රැකියා උත්පාදනයට මඟ පෑදී දිළින්දන්ට යහපතක් වනු ඇතැයි යන න්‍යාය ක්‍රියාත්මකවේ

❖සමාගම් වල බොහෝ ව්‍යාපාර කොටස් විශ්‍රාම අරමුදල් සතුව පවතින අතර ඒවායේ අවසාන වශයෙන් වාසි ලබන්නන් වනුයේ කිසි විටක ධනවත් අය නොවේ

©JMC vLearning

## සංස්ථායික සමාජ වගකීම සම්බන්ධයෙන් වන ඇල්ම ඇති පාර්ශවයන්ගේ පැත්තෙන් වන ප්‍රවේශය

ඇල්ම ඇති පාර්ශව ප්‍රවේශය පදනම්ව ඇත්තේ ආයතනය විසින් කරනු ලබන කාර්යභාරයන් සඳහා කාණ්ඩායම් රාශියක් එම කාර්යභාරයෙහි කොටස් කරුවන් වන්නේය යන උපකල්පනය මත වේ

- ❖ නවීන සංස්ථාවන්,සමාජයීය වශයෙන් ආර්ථික වශයෙන් සහ දේශපාලනික වශයෙන් බලවත් බව ඉන් යෝජනා කරන අතර සීමාවකින් තොරව ඔවුන් පාවිච්චි කරන ඔවුන්ගේ බලය අනිවාර්යයෙන්ම අනෙක් ජනතාවගේ අයිතිවාසිකම් වලට හානි ගෙන දෙනු ලබයි
- ❖ තවත් තර්කයකින් පෙන්වා දෙන්නේ සංස්ථාවන් සමාජය තුල පවතන ඒවා බවත් තමන් භාවිත කරන සම්පත් සඳහා ඒවා සමාජය මත යැපෙන බවත්ය. මෙම සම්පත් වලින් සමහරක් සැපයුම්කරුවන් හා සමග සෘජුව සම්බන්ධ වීමෙන් ලබා ගත්තද අනෙක් ඒවා එසේ නොවන අතර රජයේ වියදම් මගින් සපයනු ලබන්නේය

©JMC vLearning

JMC vLearning your virtual learning partner

## සදාචාරාත්මක ස්ථාවරය (මතය හෝ ආකල්පය)

ආයතනයක සදාචාරාත්මක ස්ථාවරය යනු එම ආයතනය බාහිර සමාජය සහ උනන්දුකාරක පාර්ශවයන්ට වන තම අවම බැඳීම කොතෙක් දුරට ඉක්මවා යන්නේදැයි යන කාරනයයි

ජොන්සන් එට් අල් (2005) සිදුවිය හැකි නිදසුන් පරාසයන් හතරක් ගෙනහැර පාමින් නිදසුන් වශයෙන් ගෙන හැර පාන්නේ,

- ❖ කෙටි කාලීන ව්‍යාපාර කොටස් හිමියන්ගේ ඇල්ම
- ❖ දිගු කාලීන ව්‍යාපාර කොටස් හිමියන්ගේ ඇල්ම
- ❖ කොටස් හිමියන්ගේ බහුවිධ බැඳීම්
- ❖ සමාජය වෙනස් කරන්නන්.

©JMC vLearning

# සංස්ථායික සමාජ වගකීම් උපායමාර්ගයන්

තම සංස්ථායික සමාජ වගකීම ප්‍රදර්ශනය කිරීම සඳහා උපායමාර්ගයක් තමන් සතුව ඇති ව්‍යාපාරයක් තම විශේෂිත ක්‍රියාවන් හඳුනාගත් හිතාමතාම සකස් කල සැලසුමක් අත ඇතිව සිටිනු ඇත

සංස්ථායික සමාජ වගකීම ක්‍රියාකාරීත්වය සඳහා උදාහරන වන්නේ,

- ❖ පුණ්‍යායතන සඳහා පරිත්‍යාග කිරීම්
- ❖ රාජ්‍ය නොවන සංවිධාන වල (NGOs) ක්‍රියාකාරීකම් සඳහා දායක වීම
- ❖ ප්‍රදේශයේ යහපත් අරමුනින් යුතුව කෙරෙන කාර්යයන් සඳහා උදව්කිරීම
- ❖ ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලියට උනන්දුකාරක පාර්ශවයන් ඇතුලත්කරගැනීම
- ❖ ව්‍යාපාරය සඳහා සමාජ සහ පාරිසරික බලපෑම කළමණාකරනය කරගැනීම.

©JMC vLearning

JMC vLearning
"your virtual learning partner"

# උපායමාර්ගික සංස්ථායික සමාජ වගකීම

සංස්ථායික සමාජ වගකීම් කටයුතු උපායමාර්ගික බවට පත්වන විට ඒවා සංවිධානයේ දිර්ඝකාලීන සාර්ථකත්වය සම්බන්ධයෙන් අවදානය සහිතව වන අතර එහෙතු කොට ගෙන සමාජයටද මෙන්ම ව්‍යාපාරයටද වාසි සහගත විය යුතුය

උපායමාර්ගික සංස්ථායික සමාජ වගකීම ආරම්භකයන් සඳහා උදාහරන වන්නේ,

- ❖ සුදුසුකම් ලද විට තම සමාගමෙන් බෙහෙත් ද්‍රව්‍ය ප්‍රභවය කරගනු (ලබාගනු ඇතැයි)ඇතැයි යන බලාපොරොත්තුවෙන් ඖෂධ සමාගම් වෛද්‍ය කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වියදම් දැරීම
- ❖ තම මූල්‍ය නිෂ්පාදනයන් මිලට ගනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් බැංකුවක් විසින් තම ජ්‍යෙෂ්ඨ පාරිභෝගිකයන්ට අන්තර්ජාල පුහුණුව ලබාදීම
- ❖සමාගමට හිතෛෂීභාවය වර්ධනය කර ගැනීමේ අරමුනින් යහපත් අරමුනු සඳහා සම්බන්ධවීමට සහ නම් කිරීමට සිය සේවක සේවිකාවන් දැරිගැන්වීම.

©JMC vLearning